## කො/ දේවි බාලිකා විද්‍යාලය කොළඹ

## පළමු වාර පරීක්ෂණය - 2014

## සිංහල භාෂාව හා සාහිත්‍ය - 9 ශ්‍රේණිය

කාලය පැය 1 1/2 යි.

**සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටස් හී අදහස් වෙන වෙන ම ලියන්න.

(අ) සේවකයාගේ කටයුතු කෙරෙහි ඇහැ ගහගෙන සිටින්න යැයි ඔහු ආරක්ෂක නිලධාරියාට පැවසී ය.

(ආ) අවුරුදු නිවාඩුව ලැබෙන තෙක් සිරිමලී ඇඟිලි ගනිමින් සිටියා ය.

02. පහත දී ඇති වචන යුගලයන් අතුරින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන තෝරන්න.

(අ) ආශ්චර්යය, /ආස්චර්‍ය්‍යය

(ආ) කනිෂ්ඨ / කණිෂ්ට

03. සිංහල අක්ෂර මාලාවේ ඇති සඤ්ඤක අකුරු යෙදී ඇති වචන දෙකක් ලියන්න.

04. අනුස්වාරය හා රකාරාංශය යෙදුනු පද දෙකක් ලියන්න.

05. ආඥාව යනු නියම කිරීම නම් පහත සඳහන් පදවල අදහස ලියන්න.

(අ) තාවුල්ල

(ආ) පරිකල්පනය.

06. පහත සඳහන් පදවලට සමාන පද ලියන්න.

(අ) හූරා

(ආ) පටහැනි

07. (අ) ජාතික - විජාතික යන යුගල පද වර්ගවයට අයත් වෙනත් යුගල පදයක් ලියන්න.

(ආ) සදාචාරය යන්නෙහි විරුද්ධ පදය දුරාචාර නම් සාවද්‍ය යන්නෙහි විරුද්ධ පදය ලියන්න.

08. පහත සඳහන් යෙදුම්වලට තනි පද ලියන්න

(අ) මවගේ මව්පිය පාර්ශ්වය හා පියාගේ මව්පිය පාර්ශ්වය

(ආ) මනාව අලංකරණය කරන ලද්දා වූ

The National e-learning portal for the General Education

09. පහත සඳහන් වාක්‍ය වල ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ වර්ගය ලියන්න.

(අ) ඔහු නවකතාවක් ලියමින් සිටියි.

(ආ) ගංවතුර හෙමින් පහව යයි.

10. පහත සඳහන් වාක්‍යයේ නාම පද ස්ත්‍රී ලිංගයට හරවා එම වාක්‍යය නිවැරදිව නැවත ලියන්න.

(අ) ගැමියා ගවයාට වතුර දෙන විට මුවා ද ඒ දෙසට පැමිණෙන්නට විය.

(ආ) පහත දී ඇති වාක්‍ය නිවැරදි කර ලියන්න.

සත්තු ඇති කරන ළමයින් උන්ට ආදරය කරති.

(2x10=20)

02. පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සසර වසන තුරු - නිවන් දකින තුරු
පිංකෙත හෙළ රන් දෙරණේ - යළි උපදින්නට
හේතු වාසනා වේවා - හේතු වාසනා //
රත්නමාලි සෑ කිරණයි - මහ බෝ සෙවණයි
තිසා වැවයි සීගිරියයි - අපේ උරුමයයි

1. මෙම ගීතයේ රචකයා කවුද?
2. මෙම ගීතයෙන් දැක්වෙන අපේ ජාතික උරුමයන් 3ක් නම් කරන්න.
3. මෙම ගීතයේ රචකයාගේ ප්‍රාර්ථනාව කුමක්ද?
4. මෙය අසන පුද්ගලයාගේ සිතෙහි ඇතිවන්නේ කෙබඳු සිතුවිල්ලක් ද?
5. රචකයා "ලක් දෙරණ" සමාන කර ඇත්තේ කුමකටද?

(1x5=5)

03. පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"අවසර රාජෝත්තමයාණන් වහන්ස, මම කියන්නේ සත්‍යක්මයි."

1. මෙම දෙබස අයත් නිර්මාණය කුමක්ද?
2. ඊට මුල් වූ කතා පුවතේ නම කුමක්ද?
3. එය කවුරුන් විසින් කියන ලද්දක් ද?
4. ගුවන් විදුලි නාටකයක අන්තර්ගත විය යුතු ලක්ෂණ 2ක් ලියන්න.

(ල.5)

04. "හුරේ හුරේ කියනවා විනා අත්තගෙන් ආ නෑ කමක්ද ...."

1. මේ කොටස අයත් කවි වර්ගය කුමක්ද?
2. අත්තා යනු කවුද?
3. මෙම කොටස අයත් පද්‍ය කීවේ කවුද?
4. මෙම පද්‍ය වර්ගයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 2ක් ලියන්න.

(ල.5)

05. "තාත්තාට දූත් විවේකයෙන් ඉන්න පුළුවන්"

1. මෙය කීවේ කවුද? කාටද?
2. මේ ප්‍රකාශයට ලද පිළිතුර කුමක්ද?
3. මෙම කොටස ඇතුළත් කෙටි කතාවේ නම කුමක්ද?
4. එහි රචකයා කවුද?
5. මෙම කෙටි කතාවට පාදක වූ අත්දැකීම කුමක්ද?

(ල.5)

06. 1. දේශාභිමානී ගීත යනු මොනවාද?

2. දේශාභිමානී ගීත වලට උදාහරණ 2ක් සපයා එම ගීත රචනා කළ ගීත රචකයන් දෙදෙනාගේ ද නම් ලියන්න.

(ල.5)

The National e-learning Portal for The General Education

07. 1. ප්‍රවෘත්තියක් යනු කුමක්ද?

2. ප්‍රවෘත්තියක තිබිය යුතු අනිවාර්ය අංග 2ක් ලියන්න.

3. ප්‍රවෘත්තියක් ලිවීමේදී අනුගමනය කරන රටාව හඳුන්වන නම කුමක්ද?

4. ප්‍රවෘත්තියක මාතෘකාව හඳුන්වන නම කුමක්ද?

(ල.5)